# ස්වයං අධ්‍යාපනයට අත්වැලක්

**ශ්‍රේණිය :- 11 ශ්‍රේණිය (පළමු වාරය )**

**නිපුණතා මට්ටම :- 6.1 රූපවාහිනී නාලිකාවල විකිශය වන නර්තන අංග විචාරයට ලක්කරයි**

**ක්‍රියාකාරකම :- 6.1 රූපවාහිනියෙන් විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් අගයමු**




සැකසුම : ඉන්දිකා ඉඹුලාවල

මප /වත් /සමුද්‍රදේවි බා.වි.

මෙහෙයවීම : නර්තන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම

## උපදෙස්

මෙය ලිඛිත පාඩමකි. මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යනය සඳහා පාසලේ ගුරු ඇසුර ලබාගත යුතුය.

## හැඳින්වීම

දෘෂ්‍ය මාධ්‍යක් වන රූපවාහිනිය අද කාඅතරත් ජනප්‍රිය වී ඇති මෙවළමකි. රූපවාහිනිය ජනතාව අතර ප්‍රචලිත වීමත් සමගම රූපවාහිනි නාලිකා රාශියක් බිහිවිය. එම නාලිකා අතරද ජනප්‍රියත්වය උදෙසා ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදන්නට විය.එයට මහගු පිටිවහලක් වුයේ මේ ජනප්‍රිය නර්තන කලාවයි.

ජනතාව අතර ජනප්‍රිය මෙම රූපවාහිනී නාලිකා පිළිබඳවත්, එමගින් විකාෂණය වන විවිධ නර්තන වැඩසටහන් ගැනත් එම වැඩසටහන් විකාෂණය මගින් එම ආයතන ලබන ප්‍රයොජන හා එම වැඩසටහන් විකාෂණයෙන් සමාජයට වන බලපෑම හා නර්තන අංග ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම සඳහා යොදාගෙන ඇති ක්‍රමෝපායන් එමගින් නර්තන කලාවේ අභිවුර්ද්ධියට වන මෙහෙය පිළිබඳව මෙම පාඩමෙන් අපි සාකච්චා කරමු.

# ජනතාව අතර ජනප්‍රිය  රූපවාහිනී නාලිකා හඳුනාගමු

රූපවාහිනිය අද්‍යතන යුගයේ සෑම නිවසකම දක්නට ලැබෙන සුලබ පාරිභෝගික භාණ්ඩයකි. එම නිසා රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ ඉඩ ප්‍රස්තාව වැඩි වශයෙන් පොදු ජනතාවට ලැබේ. මෙහි දී රූපවාහිනී ප්‍රේක්ෂකයන් වෙනුවෙන් නාලිකා ගණනාවක් බිහි වී ඇත





උදා:- ජාතික රූපවාහිනිය
දෙරණ
හිරු නාලිකාව
ස්වර්ණවාහිනිය

රූපවාහිනී නාලිකා අතරින් කිහිපයකි.

# ප්‍රේක්ෂක ආකර්ෂණය දිනාගත් රූපවාහිනිය



ශ්‍රව්‍ය දෘෂ්‍ය මාද්‍යයක් ලෙස ශනිකව පොදු ජනයා අතරට පණිවිඩ ගෙන යාමේ ප්‍රබල මාධ්‍ය ලෙස රූපවාහිනිය නම්කල හැක

අතීතයේ මෙන් පුරා රාත්‍රියක් ගෙවෙන තුරු එළිමහනේ නිදි මරමින් නර්තන රස විදින්න තරම් නිදහස් කාල වේලාවක් බොහෝ දෙනෙකුට නැත. ජීවිතය පවත්වා ගැනීම සඳහා පවතින මේ ජීවන රටාව තුල විනොදය සොයා නිවසින් පිටතට ගමන් කිරීමට අපහසු තා ඇති බොහෝ දෙනෙකුට අස්වැසිල්ලක් ගෙන එන්නේ ආලින්දයේ සිට නිදහසේ නැරබිය හැකි රූපවාහිනියයි.



නර්තනය විනෝදාස්වාදය ගෙනදෙන කලාවක් ලෙසද පොදුජනතාව අතර ප්‍රචලිත කිරීමේ ගෞරවය විශාල ප්‍රමාණයකට අයිතිය රූපවාහිනී මාධ්‍යයට හිම්විය යුතුය.

විවිධ රූපවාහිනී නාලිකා මගින් විසුරුවා හරින වැඩසටහන් මගින් ආයතනය පවත්වාගෙන යාමට ඒ ඔස්සේ කිසියම් ප්‍රතිලාබයක් උපයා ගැනීමට හා රසිකත්වය රදවා තබා ගැනීමට කරනා තරගකාරී ස්රූපය එතරම් ප්‍රායෝගික නොවේ.

නමුත් වර්තමාන නර්තන ශිල්පීන්ට තම දක්ෂතා එළිදැක්වීමට මෙම රූපවාහිනී නාලිකා වලින් විකාෂණය කරණ නර්තන වැඩසටහන් මහගු වේදිකාවකි.එමගින් රිසි සේ තම දක්ෂතාවයන් එළිදැක් වීමට නිදහස ලැබී ඇත.

රසික ආකර්ශණය දිනා ගැනිමින් ඔවුන් තම නාලිකාව වෙතම ඇදබැඳ ගැනීම සඳහා ජනප්‍රිය රැල්ලට මුවාවී කරන සමහර වැඩසටයන් ගුණාත්මක බවින් හීණ වී ඇත.එම නිසා රූපවාහිණී මාධ්‍යයන් මගින් විකාශණය වන වැඩසටහන් තෝරා බේරා නැරබීමේ හැකියාව අපසතු විය යුතුය.





නමුත් වර්තමාන නර්තන ශිල්පීන්ට තම දක්ෂතා එළිදැක්වීමට මෙම රූපවාහිනී නාලිකා වලින් විකාෂණය කරණ නර්තන වැඩසටහන් මහගු වේදිකාවකි.එමගින් රිසි සේ තම දක්ෂතාවයන් එළිදැක් වීමට නිදහස ලැබී ඇත.

# රූපවාහිනී මාධ්‍ය මගින්  වැඩසටහන් ඉදිරිපත් කරන ආකාරය



රූපවාහිනී වැඩසටහන්



සජීවී වැඩසටහන්



සංස්කරණය වැඩසටහන්

ජනප්‍රියත්වය උදෙසා ඉදිරිපත් කරණු ලබන සෑම වැඩසටහනකම අලංකාරය හා ගුණාත්මක බව රැඳී ඇත්තේ කැමරා ශිල්පියා මතයි

- සජීවී නර්තන වැඩසටහන් ඉදිරිපත් කිරීමේ දී

උදා :ශාන්තිකර්ම වැනි වැඩසටහන් ගෙන ඒ මේදී එම වැඩසටහන තාත්විකව ප්‍රෙක්ෂකයා වෙත ගෙන ඒම සඳහා  විවිධ තාක්ෂණික උපාංග හා ශිල්පක්‍රම භාවිතා කර ඇත.එමගින් ස්භාවික රූපරාමු ප්‍රේක්ෂකයා වෙත ගෙන ඒමට හැකිවී තිබේ.

නමුත් කලින් පටිගත කර සංස්කරණය කරණ ලද වැඩසටනක ස්භාවික ලක්ෂන දක්නට නොලැබුනත් අලංකාරත්වයෙන් ඉහලය.



# රූපවාහිනී නාලිකා මගින් විකාශනය වන නර්තන වැඩසටහන්

**නර්තන වැඩසටහන්**

- නර්තන තරගාවලි
- ශාස්ත්‍රීය නර්තන අංග
- නර්තන අධ්‍යාපණික වැඩසටහන්
- වාර්තාමය වැඩසටහන්
- විවිධ සාකච්ඡා

## ශාස්ත්‍රීය නර්තන අංග



දේශීය නර්තන කලාව ඇගයීම සඳහා වස්ථාවක් ලබාදෙන ශාස්ත්‍රීය වැඩසටහන් ලෙස ජාතික රූපවාහිනය මගින් විකාශනය වු

රූපණී

වැඩසටහන එවැන්නකි

# නර්තන අධ්‍යාපණික වැඩසටහන හදුනා ගනිමු



නර්තන අධ්‍යාපණික වැඩසටහන්

සංචලන

පැහැසරණිය

අධ්‍යාපණික අවශ්‍යතා පෙරදැරි කරගත් නර්තන වැඩසටහන් ද රූපවාහිනී මාධ්‍ය තුලින් දැක ගත හැකිය මෙම වැඩසටහන් මගින් විවිධ නර්තන සම්ප්‍රදායන් පිළිබද ප්‍රයෝජනවත් තොරතුරු ඉදිරිත් කෙරේ.ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් ඔස්සේ ප්‍රචාරය කරන බැවින් එකී තොරතුරු මනා ලෙස ග්‍රහනය කරගැනීමට ඒ පිළිබද උනන්දුවක් දක්වන්නෙකුට හැකියාව ඇත.

## විවිධ සාකච්ඡා හා වාර්තාමය වැඩසටහන්







සාම්ප්‍රදායික කලා ශිල්පීන් හඳුන්වා දෙමින් ඔවුන් සමග පවත්වන සම්මුඛ සාකච්ඡාමය වැඩසටහන්ද රූපවාහිනී මාධ්‍ය ඔස්සේ ඇතැම්විට ඉදිරිපත් කෙරේ.



අද්‍යතනයෙහි නිරන්තරයෙන් දක්නට නොලැබෙන ඇතැම් ශාන්ති කර්ම රූපගත කර ඒවා ප්‍රචාරය කිරීම මගින් එකී කලාංගයන් අභාවයට යාමට නොදී ආරක්ෂා කරගැනීම

# නර්තන තරගාවලි

අද්‍යතනයේ සෑම රූපවාහිනී නාලිකාවල ජනප්‍රියතම වැඩසටහන ''රියැලිටි ෂෝ''

''තරු''බිහි කරන වැඩසටහන් ද අද්‍යතන නර්තන ශිල්පීන්ගේ දක්ෂතාව කියාපෑමට ගත් උත්සාහයකි










මෙම තරු බිහි කරන වැඩසටහන් නිසා දරුවන් ගේ නර්තන කුසලතා එළිදැක් වීමට මහඟු වේදිකාවක් නිර්මාණය වන නමුත් සමහර අවස්තාවන් හීදි දරුවන් ගේ මාණසික මට්ටම මෙන්ම සාරධර්ම පිරිහෙන අවස්තා නැතුවා නොවේ.සෑම විටම ඔවුන් ජයග්‍රහනය ජනප්‍රියත්වය හබායාම ඊට හේතු පාදක විය හැක

තරුණ නර්තන ශිල්පීන්ට මෙම රියලිටි වැඩසටහන් නිසා සම්ප්‍රදායට කොටු නොවී තම අදහස් නිර්මාණාත්මකව ප්‍රාසාංගිකව ප්‍රේක්ෂකයා හමුවට ගෙන ඒමේ භාග්‍ය උදාවී ඇත. එමගින් ඔවුන් අනාගතය ද සාර්තක කරගැනීමට හැකිවීඇත.








- කවීතා

කවීතා වැනි උසස් තත්ත්වයේ වැඩසටහනක් රූපවාහිනී මාධ්‍යයකින් මිස පොදු ජනයාට නැරඹීමට අවස්ථාවක් නො ලැබේ. එනිසා එවැනි වැඩසටහන් සම්පාදනය කොට ඉදිරිපත් කළ යුතු වන අතර ඉහත දක්වා ඇති රූපවාහිනී වැඩසටහන් කාලීන ව වෙනස් වන බැවින් නව වැඩසටහන් නිෂ්පාදනයට යොමු කළ යුතු ය





## රූපවාහිනිය කෙරෙහි ප්‍රේක්ෂක අවධානය දිනා ගැනීමට හේතු වූ කරුණු

- නර්තන වැඩසටහන් ඉදිරිපත් කිරීම මගින් දෙස් විදෙස් ප්‍රේක්ෂක අවධානය දිනා ගැනීම.

- රූපවාහිනිය මඟින් විසුරුවා හරින නර්තන වැඩසටහන් එක වර විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවකට නැරඹීමට හැකි වීම

- නර්තන තරග සංවිධානය මගින්ද ප්‍රේක්ෂක අවධානය රූපවාහිනී වැඩසටහන් වෙත රඳවා තබාගැනීමට හැකිවීම





## නර්තන තරග සංවිධානය මෙන් ම එම වැඩසටහන් ප්‍රචාරය කිරීමෙන්

## රූපවාහිනී ආයතන අපේක්ෂා කල අරමුණු

- දක්ෂ හෝ ජනප්‍රිය හෝ නර්තන ශිල්පියා හා ශිල්පිනිය, දක්ෂතම නර්තන කණ්ඩායම තේරීම
- වාණිජ අපේක්ෂාවන් මූලික ව ආයතනික අරමුණු හා තරගකාරීත්වය මතු කිරීම,
- වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා උපයෝගී කර ගැනීම
- විවිධ නර්තන ශිල්පීන් හා ශිල්පිනියන් ආයතන ව්‍යාපාරික කටයුතු වර්ධනය සඳහා යොදා ගැනීම,
- ජාතික උරුමයන් රැක ගැනීම හා සංරක්ෂණය වැනි අරමුණු
- රසඥතා වර්ධනය,
- විනෝදාස්වාදය,



## නර්තනයේ විචිත්‍රත්වය සඳහා යොදා ගන්නා තාක්ෂණික ක්‍රමශිල්ප

රූපවාහිනී මාධ්‍යයෙන් එළිදක්වන නර්තනවල විචිත්‍රත්වය සඳහා විවිධ තාක්ෂණික ක්‍රමශිල්ප භාවිත කරනු ලැබේ. මෙසේ අද්‍යතන නර්තනයේ ප්‍රාසංගික ගුණය ඉස්මතු කිරීමෙහි ලා තාක්ෂණය යොදා ගැනීම පහත දක්වා ඇති අයුරින් සිදු වේ.

- අධිවේගී/මන්දවේගී දර්ශන
- සමීප - දූරස්ථ දර්ශන
- ප්‍රතිබිම්බ නිර්මාණය
- ගායනය/වාදනය තාක්ෂණික උපාය මාර්ගවලින්
- හඬ පාලනය හා සුසර කිරීම
- අවශ්‍ය රූපය පමණක් ඉස්මතු කොට පසුබිම ඉවත් කිරීම



## රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම



තාක්ෂණික ක්‍රමශිල්පවලට අමතර ව අද්‍යතන නර්තනාංගවල විචිත්‍රත්වය සඳහා රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම එහි ඖචිත්‍යයට බලපායි. රංග වස්ත්‍රාභරණ යොදා ගැනීමේ දී,

- වර්ණවල ගැළපීම
- නර්තන සම්ප්‍රදායට අදාල වීම
- සංස්කෘතියට ගැළපීම
- නිර්මාණාත්මක බව

යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය. සංගීතය යොදා ගැනීම නිසා නූතන වේදිකා නර්තනවල විචිත්‍රත්වය වැඩියෙන් පෙනේ.

මෙසේ යොදා ගන්නා සංගීතය සඳහා ශ්‍රව්‍යපට භාවිත කිරීම ද විශේෂත්වයකි. අද්‍යතන ''රියැලිටි'' වැඩසටහන් නැරඹීමේ දී විනිශ්චය මණ්ඩලයේ හරවත් උපදෙස්වලට ප්‍රේක්ෂකයෝ හා ඉදිරිපත් වන තරගකරුවෝ අවධානයෙන් සවන් දෙති. එහි දී නර්තනය පිළිබඳ විශාල දැනුමක් එකතු කර ගනු ලැබේ. මෙය අද්‍යතන නර්තන කලාවේ දියුණුවට හේතුවන කරුණකි.

